වාර්ෂික වාර්තාව සහ ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்கு அறிக்கையும்

ANNUAL REPORT AND ACCOUNTING

2021



ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

இலங்கை சமூகப் பாதுகாப்புச் சபை

SRI LANKA SOCIAL SECURITY BOARD

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා
හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில்
மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு

Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance,
Self Employment and Business Development

පූර්විකාව

I.	දැක්ම හා මෙහෙවර	3
II.	සභාපතිතුමාගේ පණිවුඩය	4
III.	සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය	5
IV.	හිටපු සභාපතිවරු, සාමාන්‍යාධිකාරිවරු	6
V.	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය 2020/2021	7
V.	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය	8
VI.	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය	9

1. පාලන අංශය 10

1.1	ස්ථාපිත කිරීම, කාර්යාල පිහිටුවීම හා වෙනස්වීම	10
1.2	අනුමත කාර්යය මණ්ඩල හා පුරප්පාඩු	10
1.3	අනුමත කාර්යය මණ්ඩල වැඩිකිරීම හා පුරප්පාඩු පිරවීම	12
1.4	2021 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම්	12
1.5	පාලන අංශයේ වර්තමාන කාර්යය මණ්ඩලය	13
1.6	පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්	13
1.7	භෞතික සම්පත්	14
1.8	සන්නිවේදන පහසුකම්	15
1.9	ප්‍රවාහන පහසුකම්	15
1.10	දැනට තිබෙන වාහනවල විස්තර	16
1.11	විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු	17
1.12	තොරතුරු තාක්ෂණ ඒකකය	18
1.13	2021 වර්ෂයේ තොරතුරු තාක්ෂණ ඒකකයෙන් සිදුකළ කාර්යයන්	18
1.14	තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යය මණ්ඩලය	18

2. සමාජ ආරක්ෂණ අංශය 19

.

2.1	ප්‍රධාන කාර්යයන්	19
2.2	ප්‍රතිලාභ ගෙවීම	19
2.3	සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල	19
2.4	යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වන නිලධාරීන්	19
2.5	සමාජ ආරක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය	20
2.6	2021 වර්ෂයේ සාමාජිකයින් බඳවාගැනීමේ ප්‍රගතිය	21
2.7	2021 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම්	24
2.8	2021 වර්ෂයේ දායකයින්ගෙන් අය කළ මුදල්	24
2.9	2021 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම වැඩසටහන්	24
2.10	සමාජ ආරක්ෂණ අංශයේ ගැටලු	25

3. මුදල් අංශය 26
3.1 පොදු කරුණු 26
3.2 ආයතනය සතු වත්කම් 27
3.3 2021 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන 27
3.4 මුදල් අංශයේ කාර්යය මණ්ඩලය 27

4. අභ්‍යන්තර විගණන අංශය 28
4.1 විෂය පථය 28
4.2 කාර්යය භාරය 28
4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 29
4.4 2021 වර්ෂයේ ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා 29
4.5 අභ්‍යන්තර විගණන අංශයේ කාර්යය මණ්ඩලය 30

5. ස්තූතිය 31

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

දැක්ම

"සමාජ ආරක්ෂණයෙන් සුරක්ෂිත වූ අභිමානවත් ජාතියක්"

මෙහෙවර

"අභිමානවත් ජාතියක් ගොඩනැගීම උදෙසා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා නියාමනය මඟින් යහපාලන ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, සුරක්ෂිතබව වෙනුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ උපාය මාර්ගික සම්බන්ධතා ගොඩ නගමින් තිරසාර සංවර්ධනයක් කරා....."

සභාපතිතුමාගේ පණිවුඩය

1996 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිතව මුදල් අමාත්‍යාංශය, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති පුරවැසියන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම සිය මූලික කාර්යභාරය කරගත් රාජ්‍ය ආයතනයකි.

සිය 25 වැනි සංවත්සරය 2021 වර්ෂයට යෙදී තිබීම ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට සිවිශේෂී වූවත් 2021 වර්ෂය පුරා පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වයත් සමඟ එය වඩාත් අභියෝගාත්මක වර්ෂයක් විය.

2021 වර්ෂය තුළ කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පැවති සීමාවන් යටතේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මෙවැනි අභියෝගාත්මක බලපෑමක් නොමැති වර්ෂවල දී ලබාගත් ප්‍රගතිය අභිබවමින් සාධනීය ප්‍රගතියක් ලභාකරගැනීමට 2021 වර්ෂයේ සමත්ව ඇත. ඒ සිය සේවා ජාලය තව තවත් පුළුල් කරමින්, නව ඉලක්ක කණ්ඩායම් රැසකගේ සමාජ ආරක්ෂණ සහතික කිරීම සඳහා නව විශ්‍රාම වැටුප් සැලසුම් හඳුන්වාදෙමින් සහ නව විශ්‍රාම වැටුප් සැලසුම් හඳුන්වාදීමටත් ආවරණය කෙරෙන ප්‍රතිලාභීන්ගේ පරාසය තව තවත් පුළුල් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ද අවසන් කරමින්ය.

ඒ අනුව ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය සඳහා 2021 වර්ෂයේදී **57,803** ක නව සාමාජික ප්‍රමාණයක් බඳවාගැනීමට සමත්වී ඇත්තේ සිය 25 වසරක ඉතිහාසය තුළ කළ ඉහලම මූල්‍යමය රැස්කිරීම් ලෙස රුපියල් මිලියන **450** ක මුදලක් වාර්තා කරමින්ය.

ගතවූ 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සිය සේවා ජාලය පුළුල් කිරීමට අදාළව දීප ව්‍යාප්ත ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සේවා මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි බැංකු ශාඛා සේවා ජාලයට සම්බන්ධ කරගැනීම, ග්‍රාම නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන්ගේ සහයෝගය තවත් ශක්තිමත් කිරීමට හා පුළුල් කිරීම ද මේ අතර විශේෂ තැනක් ගනු ලබයි.

මෙම වර්ෂයක කාල සීමාව තුළ නව ඉලක්ක කණ්ඩායම් රැසක් සඳහා නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම හඳුන්වාදීමට හැකිවීම සහ එවැනි නව ඉලක්කගත කණ්ඩායම් බොහොමයක් වෙත ආවරණය කිරීමට මූලික කටයුතු ආරම්භ කිරීම ද සිදුකරන ලදී. මේ අතර වෙළඳ නාවික ප්‍රවාහන කේෂ්ත්‍රයේ නියුතු නාවිකයින් වෙනුවෙන් "නාවිකයා" සමාජ ආරක්ෂණ ක්‍රමය හඳුන්වාදීම, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ යෝජනා පරිදි සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් ශාසනයට කුල දරුවන් පූජා කළ ගෞරවණීය භික්ෂූන්වහන්සේලාගේ සහ දසසිල් මාතාවන්ගේ දෙමාපියන් සඳහා "බුදුපුත් මාපිය හරසර" විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වාදීම, පතල් කර්මාන්තය ආශ්‍රිත සේවා නියුක්ත සේවකයින් සහ දීප ව්‍යාප්ත දේවාල සේවකයින් වෙත විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වාදීම ආරම්භ කරන ලද ව්‍යාපෘතීන් අතර අතලොස්සක් පමණි.

එමෙන්ම මේ වනවිටත් ආරම්භකර ඇති සහ අවසාන අදියරේ පවතින ව්‍යාපෘතීන් අතර ගෞරවණීය භික්ෂූන්වහන්සේලා වෙනුවෙන් සකස්කරන ලද "බුදුපුත් හරසර" සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය, පෞද්ගලික බස් රථ සේවකයින් වෙනුවෙන් වූ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, සෞභාග්‍ය නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ද ප්‍රමුඛස්ථානයේ පවතියි.

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන ජනතාවගේ විශ්‍රාම දිවිය සමාජීය සහ ආර්ථිකමය වශයෙන් සුරක්ෂිත කිරීම සඳහා වූ මෙම තිරසාර වැඩපිළිවෙල තව තවත් ශක්තිමත් කරමින් අත්කරගත් ප්‍රගතිය අඛණ්ඩව පවත්වාගෙනයාම මෙන්ම විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සමාජගත කිරීම මගේ අභිප්‍රායයි.

වසර 25 ක කාලයක් පුරා ක්‍රියාත්මකව පවතින ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සියලුම නිලධාරීන්ගේ සහයෝගය සහ උසස් කැපවීම හේතුවෙන් මෙපමණ කාලයක් අඛණ්ඩව ජනතාවට සේවයකරන, මෙකී ජයග්‍රහණයන් ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් සහයෝගය ලබා දුන් සියලුම නිලධාරීන් වෙත කෘතඥතාවය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

සභාපති
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් හඳුරාගම
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
2022.02.01

සමන් හඳුරාගම
සභාපති
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
නො: 18, රාජගිරිය පාර, රාජගිරිය

සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය

2020 වසරේ අභිනවයෙන් පත්වූ සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය හා කාර්මික උපදේශන කමිටුව යටතේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අරමුණු ලභා කරගැනීම සඳහා දැමූ පදනම වඩාත් ශක්තිමත් කරමින් තම ඉලක්කවල ඉහළම අගයක් ලභා කරගත් සුවිශේෂී වසරක් ලෙස 2021 වසර හැඳින්විය හැකිය.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය එහි ඉතිහාසයේ වාර්තාගත වැඩිම ආදායම ඉපයූ වර්ෂය ලෙස 2021 වසර වාර්තා අතරට එක්විය. එසේම, මෙය එක් වසරක් තුළ බඳවාගත් දායකයින් අතරින් සක්‍රීය දායකයින් වැඩිම සංඛ්‍යාවක් පවත්නාවූ වසරක් ලෙසද සටහන් වේ. 2020 වසරේ 150කට පමණ සීමා වී තිබුනු සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා සාමාජිකයින් බඳවාගැනීමේ නිලධාරී ජාලය මුලු රටම වෙලාගත් 40,000 ඉක්මවා ගිය බඳවාගැනීම් ජාලයක් බවට පත්කර ගැනීම මේ සඳහා බලපෑ තීරණාත්මකව සාධකයක් විය.

තවද, දිස්ත්‍රික්ක මට්ටමට සීමා වී ඇති ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සෘජු නිලධාරී ජාලය බිම් මට්ටම කරා ව්‍යාප්ත කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 335 දක්වාම ව්‍යාප්ත කිරීම සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නිලධාරියෙකු අනුයුක්ත කරගැනීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගැනීමට 2021 වසරේදී හැකිවිය.

සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳව සම්ප්‍රදායිකව ශ්‍රී ලංකා පුරවැසියන් දැනුවත් කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය වූ ඒකරාශී කරගත් කණ්ඩායම් දැනුවත් කිරීමේ ක්‍රමවේදය අභිබවමින් නූතන තාක්ෂණය සමඟ එක්වෙමින් වේගවත්ව මුලු රටම වෙලාගත් දැනුවත් කිරීමේ ක්‍රියාන්විතයක් අප මණ්ඩලයේ වත්මන් සභාපතිතුමාගේ නිසඟ හැකියාවන් මුසුකරමින් සමාජ මාධ්‍යය, ගුවන් විදුලි, රූපවාහිනී, පුවත්පත් මාධ්‍යය හරහා ක්‍රියාත්මක කිරීමට හැකිවීම තුළින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය වඩ වඩාත් ජනතාව අතරට ගෙන යාමට මෙම වසරේ දී අපට හැකිවිය.

රාජ්‍ය විශ්‍රාම වැටුපක් හෝ සේවක අර්ථසාධක අරමුදලකින් තම සැදෑ සමය සුරක්ෂිත කර ගැනීමට අවස්ථාවක් නොලද සුවහසක් ශ්‍රී ලාංකික ජනතාව සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභවලින් සුරක්ෂිත කිරීම සඳහා වූ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වගකීම සියලුම නිලධාරීන් තම රාජකාරියෙන් ඔබ්බට ගිය සමාජ වගකීමක් ලෙස සලකා කටයුතු කිරීමේ අවශ්‍යතාවය දැඩිව මතුවී ඇත. ඒ සඳහා 2021 වසරේ මෙන්ම ඉදිරියේදීත් මෙම සත්කාරය සඳහා අප කාර්යය මණ්ඩලය කැප වන බව සටහන් කරමින් 2021 වසරේ ජයග්‍රහණය සඳහා උරදුන් සියලු දෙනාට මාගේ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

මෙම ජයග්‍රහණ ලබාගැනීමට නිසි මඟ පෙන්වීම හා උපදෙස් අප වෙත නිරන්තරයෙන් සැපයූ අප රාජ්‍ය අමාතයංශයේ ගරු ලේකම් නීල් බණ්ඩාර හපුහින්න මහතාටත්, අතිරේක ලේකම්තුමිය ඇතුළු නිලධාරීන්ටත් , අප මණ්ඩලයේ කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා නිසි නායකත්වය සැපයූ ගරු රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමාටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

කේ.ඒ.එස්.පී කළුආරච්චි
සාමාන්‍යාධිකාරී
2022.02.18

හිටපු සභාපතිවරු

නම	කාල සීමාව
වී. ජෙගරාසසිංගම් මහත්මිය	1997.01.01 - 1999.11.01
එස්. කාරියවසම් මහතා	1999.11.08 - 2000.11.01
කේ. ජයලත් මහතා	2000.11.24 - 2002.02.06
ආර්.එම්.ඩි.බී. බෝගහකුඹුර මහතා	2002.02.07 - 2004.01.25
ආනන්ද ගාල්ලෙආරච්චි මහතා	2004.02.03 - 2004.06.01
ඩී.කේ.ආර්.වීරසේකර මහතා	2004.06.15 - 2005.12.15
ලක්ෂ්මන් හිරිමුතුගොඩ මහතා	2005.12.27 - 2006.09.18
සුනිල් සමරවීර මහතා (වැ.බ.)	2006.09.19 - 2006.10.11
සරත් කීර්තිරත්න මහතා	2006.10.12 - 2010.05.05
නිමල් චන්ද්‍ර අමරසිංහ මහතා	2010.05.17 - 2011.12.31
නීතිඥ සුමනා ආරියදාස මහත්මිය	2012.01.03 - 2015.01.21
සුමතිපාල කාරියවසම් මහතා	2015.02.10 - 2015.12.07
කීර්ති සුරංජිත් මාවැල්ලගේ මහතා	2015.12.09 - 2018.05.15
ජේ. ඒ. එස් ජයකොඩි මහතා	2018.05.18 - 2018.10.26
දේවක වීරසිංහ මහතා	2019.02.11 - 2019.12.06

හිටපු සාමාන්‍යාධිකාරිවරු

නම	කාල සීමාව
රණතුංග හේමචන්ද්‍ර මහතා	1996.09.25 - 1998.08.31
අශෝක පීරිස් මහතා	1998.09.01 - 2000.02.01
බී.ඒ.සෝමපාල මහතා	2000.02.02 - 2002.08.16
කේ.ජී.ජී. විජේවර්ධන මහතා	2002.09.16 - 2003.12.31
පී.ඊ.සි. නේසයියා මහතා	2004.01.01 - 2007.10.12
ජේ.එම්. විජයරත්න මහතා	2008.01.01 - 2009.07.23
එන්.ජේ. පතිරණ මිය	2009.07.24 - 2010.07.23
කේ.එන්.ජේ. කුරේ මහතා	2010.07.27 - 2012.01.26
ධම්මික පාදුක්ක මහතා	2014.03.17 - 2017.11.09
කේ. ඒ. තිලකරත්න මහතා	2018.01.16 - 2018.07.15
බී.ටී.කේ.නිශ්ශංක මහතා	2019.12.02 - 2020.06.20
නිමල් කොටවලගෙදර මහතා	2020.06.22 - 2020.12.22

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය - 2020/2021



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් හඳුරාගම මහතා
B.A. (Special) Sociology (Hons) (CMB),
MA in Sociology (CMB), CTHE (CMB)
සමාජ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති



ඩඩ්.එම්.සුනිල් ශාන්ත වීරසේකර මහතා
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ
ක්‍රියාකාරී අධ්‍යක්ෂක



කේ.එම්.කුමාරසිරි මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය
ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල්
අමාත්‍යාංශය



ජානක රත්නායක මහතා නීතිඥ
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



එච්.ආර්.පරශක්ති සේනානායක මහතා
නීතීඥ
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ධම්මික දිසානායක මහතා
ආචාර්යය,
සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



අරුණ කුමාරවඩු මහතා
ඉංජිනේරු
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය



ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යයභාරය

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන් වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වේ.

1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පනතේ ප්‍රකාරව 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/5 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කරන ලද යෝජනාක්‍රම 06 ක් ක්‍රියාත්මක කරන ලදී.

ආර්ථික වශයෙන් ඵලදායී යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම හා සාමාජිකයින් වෙත ඉහළ හා සුරක්ෂිත විශ්‍රාම වැටුපක රැකවරණය සැලසීම පෙරදැරිව වර්තමානය වන විට “සුරැකුම” යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත.

සුරැකුම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18 සිට 59 දක්වා රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන්ට දායකවිය හැකි අතර, වාරික ගෙවීමේ හැකියාව මත සාමාජිකයාට අවශ්‍ය ප්‍රමාණයක විශ්‍රාම වැටුප් ලබාගත හැකිය.

2012 ඔක්තෝම්බර් 11 දිනට යෙදී තිබුණ "ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය" ට සමගාමීව "ආරම්භය" පුර්ව සැලසුම් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. එම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18ට අඩු දරුවන්, සිය දෙමාපිය/ භාරකරු භාරකත්වය යටතේ සාමාජික කල හැකි අතර, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු ඔවුන් සුරැකුම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරුකර ගිණුමේ පවතින ශේෂය අනුව විශ්‍රාම වැටුප් හිමිකම ලබාදේ.

යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

- වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා සාමාජිකයාට මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
- සාමාජිකයා විශ්‍රාමිකයෙකු ලෙස මියගිය විට සමාජිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප ගෙවීම.
- ස්ථිර අර්ධ අබලතාවක දී වයස අනුව ගැලපූ රු.25,000/- දක්වා පාරිතෝෂික මුදලක් සහ නියමිත වාරික ගෙවීමෙන් පසු වයස අවුරුදු 60 සිට විශ්‍රාම වැටුප
- ස්ථිර පූර්ණ අබලතාවක දී වයස අනුව ගැලපු රු.50,000/- දක්වා පාරිතෝෂිකය සහ ශුද්ධ දායක මුදල හෝ අබලතාවට පත් වූ දිනයේ සිට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුප
- විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගියහොත් යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන පාරිතෝෂිකයක් ලබාදීම.

යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබාගැනීම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් බලය පවරන ලද නිලධාරීන් මඟින් සිදුකළ හැකිය.

වාරික ගෙවීම ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, තැපැල් කාර්යාල හා බලය පවරන ලද ග්‍රාම නිලධාරීන් මඟින් හා මෙම මණ්ඩලයේ කාර්යාල මඟින් සිදුකළ හැකිය.

1. පාලන අංශය

1.1. ස්ථාපිත කිරීම, කාර්යාල පිහිටුවීම හා වෙනස්වීම

1996 වර්ෂයේ දී සුවසිරිපායේ පිහිටි සෞඛ්‍ය, මහාමාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශයේ දී 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත යටතේ 1996 ඔක්තෝම්බර් මස 16 වන දින ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු ආරම්භ කරන ලදී. ඉන් අනතුරුව බොරැල්ලේ පිහිටි සමාජ සේවා දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ල තුළ සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවන ලදී.

1997 මාර්තු මාසයේ දී කොළඹ 06, ගාලු පාරේ, අංක 585 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල බදු ගිවිසුමක් මත කුලියට ගෙන මණ්ඩල කාර්යාලය එහි පිහිටුවීම දෙවන අදියර යටතේ සිදුවිය. අනතුරුව 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත මඟින් මුල් පනත සංශෝධනය කරන ලදී. අනතුරුව 2003.07.01 දින සිට නුගේගොඩ, නාවල පාරේ, අංක 150 ඒ, දරණ ස්ථානයේ කාර්යාලය ස්ථාපනය කරන ලදී.

2010.04.30 දින සිට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට පත්වීමත් සමඟ 2010.12.01 වන දින සිට අංක 125, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය ස්ථාපනය කරන ලදී.

2013.03.06 දින ප්‍රධාන කාර්යාලය අංක 18, රාජගිරිය පාර, රාජගිරිය යන ලිපිනයේ මණ්ඩලය විසින් මිල දී ගත් ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලද අතර, එය "සමාජ ආරක්ෂණ පියස" ලෙස නම් කෙරින. මෙමඟින් වඩාත් විශ්වාසදායි හා කාර්යක්ෂම සේවාවන් සැපයීමට හැකියාව ලැබී තිබේ. වර්තමානය වන විට සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර සේවා කටයුතු වඩාත් පුළුල් කර ඇත.

1.2. අනුමත කාර්යය මණ්ඩලය හා පුරප්පාඩු

1999 සිට වරින්වර සේවක මාරුවීම්, ඉල්ලා අස්වීම් නිසා පුරප්පාඩු දිගින් දිගටම පැවති අතර, එවකට සේවයේ යෙදී සිටි ස්ථීර කාර්යය මණ්ඩලය 179 දෙනෙකි. තනතුරු අනුව එම සේවක සංඛ්‍යාව බෙදී ඇති අයුරු පහත වගුවේ දැක්වේ. කාර්යය මණ්ඩලයේ ප්‍රමාණවත් නොවීම මත ආයතනයේ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා නොවන බැවින්, කටයුතු වඩාත් පුළුල් කිරීම සඳහා 198 කින් සමන්විත නව කාර්යය මණ්ඩලයක් සඳහා මහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබා දී ඇති අතර, අදාළ බඳවාගැනීමේ පටිපාටිය සකස් කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2012.09.14 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුමත කරන ලදී.

2021.12.31 දින වන විට ආයතනයේ පුරප්පාඩු 33ක් පවතින අතර, මුදල් අමාත්‍යාංශය විසින් 2021.08.28 දින යොමු කරන ලද අංක MF/NB/07/CM/2021/163 අංක දරණ රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය හා 2021.09.06 දින සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අංක SMS/ACC/11/Budget / 2022 දරණ ලිපිය මඟින් සේවක බඳවාගැනීම් කල්තබා ඇති බැවින්, මෙම පුරප්පාඩු වූ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි වී ඇත.

කාර්යය මණ්ඩල විශ්ලේෂණය - 2021 වර්ෂය
(2021.12.31 දිනට)

අනු අංකය	තනතුරු නාමය	අනුමත	දැනට සිටින	පුරප්පාඩු
1	සාමාන්‍යාධිකාරි	1	1	0
2	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය)	1	1	0
3	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සමාජ ආරක්ෂණ)	1	1	0
4	සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය)	1	1	0
5	සහකාර සාමාන්‍යාධිකාරි (බදවා ගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන)	1	1	0
6	සහකාර සාමාන්‍යාධිකාරි (පාලන)	1	1	0
7	සහකාර සාමාන්‍යාධිකාරි (විශ්‍රාම වැටුප්/රක්ෂණ)	1	1	0
8	අභ්‍යන්තර විගණක	1	1	0
9	කළමණාකරු (පාලන)	1	1	0
10	කළමණාකරු (ඔප්පු සේවා)	1	1	0
11	කළමණාකරු (රක්ෂණ)	1	1	0
12	ගිණුම් නිලධාරි (මූල්‍ය)	1	1	0
13	සමාජ ආරක්ෂණ නිලධාරී (ප්‍රවර්ධන)	1	1	0
14	සමාජ ආරක්ෂණ නිලධාරි (විශ්‍රාම වැටුප්)	1	1	0
15	සමාජ ආරක්ෂණ නිලධාරි (තොරතුරු තාක්ෂණ)	1	1	0
16	ගිණුම් නිලධාරි (රැස්කිරීම්)	1	1	0
17	ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි	6	6	0
18	විගණන නිලධාරීන්	2	2	0
19	සම්බන්ධීකරණ නිලධාරීන්	49	42	7
20	විමර්ශන නිලධාරීන්	2	2	0
21	දත්ත පරිපාලක	1	1	0
22	පරිගණක ජාල සහකරු	1	0	1
23	පරිගණක වැඩසටහන් සහකාර (මෘදුකාංග)	1	1	0
24	පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග)	1	1	0
25	පොත් තබන්නා	2	1	1
26	කළමනාකරණ සහකාර	74	58	16
27	රියදුරු	9	6	3
28	කාර්යාල කාර්ය සහායක	34	30	4
එකතුව		**198**	**166**	**32**

1.3. අනුමත කාර්යය මණ්ඩලය වැඩි කිරීම හා පුරප්පාඩු පිරවීම

මණ්ඩලයේ ඉලක්කගත අරමුණු හා පරමාර්ථ ළඟා කරගැනීම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය ස්ථාපිත කිරීමත් පුහුණුව සහ සංවර්ධනය තුළින් ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම සිදු කරනු ලබන අතර, කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් අනුමත කාර්ය මණ්ඩලය වන 198 ප්‍රමාණය 561 දක්වා වැඩි කර ගැනීම සඳහා ආයතනික ප්‍රතිව්‍යුහගතකරණ යෝජනාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමුකර ඇත.

එමෙන්ම, මුදල් අමාත්‍යාංශය විසින් 2021.08.28 දින යොමු කරන ලද අංක MF/NB/07/CM/2021/163 අංක දරණ රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය හා 2021.09.06 දින සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අංක SMS/ACC/11/Budget / 2022 දරණ ලිපිය මඟින් සේවක බඳවාගැනීම් කල්තබන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින්, පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවාගැනීම් නවත්වා ඇති අතර, අත්‍යවශ්‍ය තනතුරු සඳහා අනුමැතිය ලබාගෙන බඳවාගැනීම් සිදුකරන ලදී.

ඒ අනුව, පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම් ඉදිරියේදී සිදුකර ඉහළ සේවා ඵලදායිතාවක් ළඟා කරගැනීමටත් කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

1.4. 2021 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම්

	නම		තනතුර		
01.	ජේ.ඒ.ජයන්ති පෙරේරා මිය	-	කාර්යාල කාර්ය සහායක	-	විශ්‍රාම යාම
02.	ඒ.එස්.එම්.ඉර්සාත් මයා	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
03.	ඉරේෂා ප්‍රේමිලා මදුෂානි මිය	-	කළමනාකරණ සහකාර	-	ඉල්ලා අස්වීම
04.	ජී.පී.පරණමාන මිය	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
05.	කේ.පී.ආර්.සී.කළුපහන මයා	-	රියදුරු	-	සේවය අතහැර යාම
06.	ඊ.ජී.ඩී.සුරවීර මයා	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
07.	විශ්ව මධුෂිත් පෙරමුණ මයා	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
08.	සසිනා කල්පනී මිය	-	කළමනාකරණ සහකාර	-	ඉල්ලා අස්වීම
09.	කේ.කේ.සමන්ත ලක්සිරි මයා	-	රියදුරු	-	ඉල්ලා අස්වීම

1.5. පාලන අංශයේ වර්තමාන කාර්යය මණ්ඩලය (2021.12.31 දිනට)

තනතුර	නිලධාරි සංඛ්‍යාව
සාමාන්‍යාධිකාරී	1
සහකාර සාමාන්‍යාධිකාරි (පාලන)	1
කළමනාකරු (පාලන)	1
කළමනාකරණ සහකාර	7
සභාපතිතුමාගේ ලේකම් (කළමනාකරණ සහකාර)	1
කාර්යාල කාර්ය සහයක	1
කාර්යාල කාර්ය සහයක (සභාපතිතුමාට අනුයුක්ත)	1
තැපැල් කටයුතු (කාර්යාල කාර්ය සහයක)	1
දුරකථන ක්‍රියාකරු (කාර්යාල කාර්ය සහයක)	1
රියදුරු	6
බහුකාර්ය සංවර්ධන සහයක	1
එකතුව	**22**

1.6. පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ දී ආයතනික පරිපාලන කටයුතු හා පරිපාලන ව්‍යුහය ශක්තිමත්ව හා ඵලදායීව පවත්වාගෙන යාම පරිපාලන අංශය වෙත පැවරී තිබේ. ආයතනයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා සැලසුම්කරණය , සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම, රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛන ප්‍රකාරව කටයුතු කිරීම හා අනෙකුත් සේවා අංශයන්ගේ කටයුතු වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය සහයෝගය පාලන අංශය විසින් ලබා දීමේ දී පහත සඳහන් මූලික කාර්යභාරයන් ඉටු කරනු ලැබේ.

1. අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, පුහුණු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම, වැටුප් වර්ධක ලබා දීම, වැටුප් වැඩිකිරීමේ පරිවර්තන සිදු කිරීම සහ සුදුසුකම් සැපිරීමෙන් පසු උසස් වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

2. ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නිසිලෙස නඩත්තු කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී විනය කටයුතු සිදු කිරීම.

3. ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

4. ආයතනයේ ප්‍රවාහන කටයුතු, වාහන නඩත්තු කටයුතු, ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා ලබා ගැනීමේ දී ගිවිසුම් ඇති කර ගැනීම.

5. වාර්ෂික වාර්තා, සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අනෙකුත් මාසික, ත්‍රෛමාසික සියලු වාර්තා සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු අමාත්‍යාංශය වෙත යොමු කිරීම.

6. දිවයින පුරා ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු විධිමත් කර ගැනීම සඳහා අභ්‍යාසලාභී උපාධිධාරීන් 58000 ක් බඳවා ගැනීමේ රජයේ වැඩපිළිවෙල යටතේ බඳවා ගෙන ඇති උපාධිධාරීන් 360ක් අප ආයතනය වෙත අනුයුක්ත කර ගැනීම සඳහා වන ඉදිරි කටයුතු සිදුකිරීම.

7. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මඟින් බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක පුහුණුලාභීන් අප ආයතනය වෙත අනුයුක්ත කර ගැනීමට අදාළව ඉදිරි කටයුතු සිදුකිරීම.

8. වර්ෂ අවසාන කාර්ය සාධන වාර්තාව සකස්කර අමාත්‍යාංශය වෙත යොමු කිරීම.

9. තාක්ෂණික උපදේශන කමිටුව සඳහා අවශ්‍ය පත්‍රිකා සකස්කර ඉදිරිපත් කිරීම හා රැස්වීම් පැවැත්වීමේ කටයුතු සංවිධානය කිරීම.

10. පරිගණක අංශය මඟින් ලංකාව පුරා විසිරි ඇති දිස්ත්‍රික් කාර්යාල 25 කටයුතු සිදු කිරීමට අවශ්‍ය පරිගණක ජාල පහසුකම් ලබා දීම.

11. මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන නියෝග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

12. කාර්ය මණ්ඩලයේ දෛනික පැමිණීමේ වාර්තා ගොනු නඩත්තු කර ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල 25 මාස 06කට වරක් නිවාඩු වාර්තා සියළුම කර්යමණ්ඩලයට නිකුත් කිරීම සහ මාසිකව වාර්තා ගොනු කිරීම.

13. කාර්යමණ්ඩලයේ අග්‍රහාර රක්ෂණ අරමුදලේ සාමාජිකත්වය ලබා ගෙන ඇති අයගේ රක්ෂණ වාරික මුදල් පිළිබඳ වාර්තා සකස් කර මාසිකව රක්ෂණ භාර අරමුදලට යොමු කිරීම හා රක්ෂණ ආවරණ ඉල්ලීම් සඳහා කඩිනමින් මුදල් ලබාගැනීමේ අවශ්‍ය කටයුතු කිරීම.

14. දෛනිකව ආයතනයට ලැබෙන සියළුම ලිපි ලේඛණ පරීක්ෂාකර බලා සභාපති, සාමාන්‍යාධිකාරි අදාළ අංශ ප්‍රධානීන් වෙත නොපමාව යොමු කිරීම මෙන්ම දිස්ත්‍රික් කාර්යාල හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත යොමු කළ යුතු ලිපි හා පාර්සල් කඩිනමින් තැපෑලට යොමු කිරීම.

15. කාර්යමණ්ඩලයේ මාරු මණ්ඩල රැස්වීම් පවත්වා ඒ අනුව ස්ථානමාරුවීම් සඳහා අවශ්‍ය ලිපි නිකුත් කිරීම හා ආයතනයේ රාජකාරි අවශ්‍යතාවය මත සිදුකරන ස්ථාන මැරුවීම් සඳහා කටයුතු කිරීම.

16. මාසිකව,ත්‍රෛයි මාසිකව හා වාර්ථා ,අභ්‍යන්තර විගණන විමසුම් හා රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු යොමු කිරීම හා විගණන රැස්වීම් සඳහා සහභාගි වීම.

17. තාක්ෂණික කමිටු රැස්වීම් සඳහා සහභාගි වීම ,අවශ්‍ය තාක්ෂණික කමිටු පත්‍රිකා සකස් කිරීම හා රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා දීම.

18. අත්‍යවශ්‍ය ආයතනික කටයුතු සඳහා අවශ්‍ය කැබිනට් පත්‍රිකා සකස් කිරීම හා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.

19. ආයතනික ප්‍රතිව්‍යුහගතකරණයට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.

20. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.

1.7. භෞතික සම්පත්

ප්‍රධාන කාර්යාලය - 2013 මාර්තු මස 06 දින අංක 18, රාජගිරිය පාර, රාජගිරිය පිහිටි මහල් 04කින් යුත් මණ්ඩලයටම අයත් ගොඩනැගිල්ලක ස්ථාපිත කර ඇත.

දිස්ත්‍රික් කාර්යාල - දිවයින පුරා සියලු දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සමාජ ආරක්ෂණ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපනය කර ඇත.

1.8. සන්නිවේදන පහසුකම්

ආයතනය සඳහා ලබාගෙන තිබූ දුරකතන පද්ධතිය වැඩි දියුණුකර සෑම අංශයක්ම ආවරණය වන පරිදි නව ගොඩනැගිල්ලේ ස්ථාපනය කරන ලද අතර, ඒ සඳහා පොදු දුරකථන සම්බන්ධතා 03ක් ෆැක්ස් පහසුකම් ද සමඟ ස්ථාපනය කර ඇත. ඊට අමතරව පහත පරිදි සෘජු දුරකථන සම්බන්ධතා ලබා ගෙන ඇත.

සභාපති	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්
ක්‍රියාකාරී අධ්‍යක්ෂ	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්
සාමාන්‍යාධිකාරි	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි 02	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක දෙකක්
සහකාර සාමාන්‍යාධිකාරි 03	-	දුරකථන තුනක්
අභ්‍යන්තර විගණක	-	දුරකථන එකක්
රැස්කිරීම් අංශය විසින් තැපැල් කාර්යාල හා සම්බන්ධ වීමට	-	දුරකථන දෙකක්
ක්ෂණික ඇමතුම්	-	දුරකථන එකක්

ඉහත දුරකථන සම්බන්ධතාවලට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25ක් සඳහා ද දුරකථන පහසුකම් ලබා දී ඇත. ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලගත පද්ධතිය ස්ථාපිත කරන ලද අතර, VPN පද්ධතියක් හරහා දිස්ත්‍රික් කාර්යාල වෙත ජාලගත කරමින් සේවා කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට පියවර ගෙන ඇත.

1.9. ප්‍රවාහන පහසුකම්

2021.12.31 දින වන විට කැබ් රථ 02 , කාර් රථ 02, වෑන් රථ 01, ත්‍රී රෝද රථ 01 හා යතුරු පැදි 15ක් ලෙස සියලුම වාහන 21ක් මණ්ඩලය සතුවේ. මේ අතුරින් එක් යතුරුපැදියක් අබලන් තත්ත්වයෙන් පවතින බැවින් දැනට යතුරු පැදි 14ක් පමණක් අප ආයතනය විසින් භාවිතා කරනු ලබයි.

එම වාහනවලින් කැබ්රථ 02ක් 1997 හා 1998 යන වර්ෂවල මිලදී ගෙන ඇති අතර, කාර් රථය 2008 වර්ෂයේදී ද, නිසාන් ජූක් කාර් රථය 2013 වර්ෂයේදී ද, බජාජ් වර්ගයේ ත්‍රී රෝද රථය 2013 වර්ෂයේදී ද, ටොයොටා හයිඒස් වෑන් රථය 2014 වර්ෂයේදී මිලදී ගෙන ඇත. එමෙන්ම බජාජ් වර්ගයේ යතුරු පැදි 09ක් 2011 වර්ෂයේදී ද, අනිකුත් යතුරු පැදි 05ක් 2014 වර්ෂයේදී මිලදී ගන්නා ලදී.

2017 වර්ෂයේ දී මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වසර පහක් සඳහා කාර් රථ දෙකක්, ඩබල් කැබ් රථයක් හා ජීප් රථයක් ලබාගෙන ඇති අතර, පිළිවෙලින් 2022.06.30, 2022.11.22 දිනයන්හි අදාළ ගිවිසුම් අවසන් වීමට නියමිතව ඇත.

1.10. දැනට තිබෙන වාහනවල විස්තර (2021.12.31 දිනට)

වාහන අංකය	වර්ගය	පළමුව ලියාපදිංචි කල දිනය	ඉතා හොඳයි	හොඳයි	අළුත්වැඩියා කර ධාවන තත්ත්වයේ පවතී	අබලන්	ගර්හිත
250 - 6095	කැබ් රථය	1997.10.24			√		
252 - 5463	ඩබල් කැබ් රථය	1998.08.14			√		
KH- 4506	කාර් රථය	2008.09.30		√			
KX- 0914	නිසාන් ජූක් කාර් රථය	2013.10.17		√			
NB - 8428	ටොයොටා හයිඒස් වෑන් රථය	2014.08.18	√				
SP CAU-7691	TOTOTA – AXIO G වර්ගයේ කාර්	2017.06.29	√				
SP CAU-7694	TOTOTA – AXIO	2017.06.29	√				
SP PH-9137	ඩබල් කැබ් රථය FORD RANGER වර්ගයේ	2017.06.29	√				
WP CAH- 4984	ජීප් රථය TOYOTA-FORTUNER වර්ගයේ	2017.11.21	√				
WP AAG -9346	බජාජ් වර්ගයේ ත්‍රී රෝද රථය	2013.04.18		√			
WP WK-3810	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3806	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3789	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3880	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3815	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06			√		
WP WK-3795	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3801	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3882	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3787	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WD-5580	කිනෙටික් වර්ගයේ යතුරු පැදිය	2010.12.31				√	
WP BAR-3240	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2014.01.27		√			
WP BAR-3263	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2014.01.27		√			
WP BAR-3250	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2014.01.27		√			
WP BAU-0765	ස්කූටි වර්ගයේ යතුරු පැදිය	2014.03.19		√			
WP BAU-0769	ස්කූටි වර්ගයේ යතුරු පැදිය	2014.03.19		√			

1.11. විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු

1. සමාජ ආරක්ෂණය ගම් මට්ටමින් දීප ව්‍යාප්ත කිරීමේ දී, ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව කාර්යය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය අධ්‍යයනය කිරීම මඟින් තහවුරු කර ගන්නා ලදී. ඒ අනුව, දිවයින පුරා ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු විධිමත් කර ගැනීම සඳහා අභ්‍යාසලාභී උපාධිධාරීන් 58000 ක් බඳවා ගැනීමේ රජයේ වැඩපිළිවෙල යටතේ බඳවා ගෙන ඇති උපාධිධාරීන් 360 අනුයුක්ත කර ගැනීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත ලිඛිත ඉල්ලීමක් සිදුකර ඇත.

භෞතික සම්පත් ඌණතා

1. පවතින රථවාහන සංචිතය තුළ පැරණි වාහන අධික වීම හේතුවෙන් අළුත්වැඩියා වැය අධික වන නිසා නව වාහන මිල දී ගැනීමට කටයුතු කළ යුතු වේ.
2. දිස්ත්‍රික් කාර්යාල වෙත සේවා කටයුතු විමධ්‍යගත කිරීම සඳහා, භෞතික හා මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම.
3. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ දැනට කාර්යය මණ්ඩලය සඳහා රැස්වීම් පැවැත්වීමට පහසුකම් නොමැති බැවින් ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට අවශ්‍යව කටයුතු සිදුකල යුතුව ඇත.
4. මෙම මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර ඇති අතර, මෙහෙයුම් කටයුතු සිදුකිරීමේ දී නිලධාරින්ගේ ප්‍රවාහන රාජකාරි අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් වාහන නොමැති බැවින් ඒ සඳහා පහසුකම් ඇති කිරීම.

1.12. තොරතුරු තාක්ෂණ ඒකකය

ප්‍රධාන කාර්යයන්

1. නව විශ්‍රාම වැටුප් තොරතුරු කළමනාකරණ මෘදුකාංග පද්ධති ස්ථාපනය කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
2. ආයතනයේ නව වෙනස්කම් සිදුකිරීමේ හා අනෙකුත් කර්තව්‍යයන් සඳහා ඉහළ කළමනාකාරිත්වයට අවශ්‍ය වාර්තා ලබා දීම.
3. පරිගණක ජාලය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.
4. ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත පරිගණක වැඩසටහන් බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාම හා සුරක්ෂිත භාවය තහවුරු කිරීම.
5. පවතින මෘදුකාංග පද්ධතියේ දත්ත සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ ඉදිරි පියවර ගැනීම

1.13. 2021 වර්ෂයේ තොරතුරු තාක්ෂණ ඒකකයෙන් සිදු කළ කාර්යයන්

1. යෝජිත මෘදුකාංග පද්ධතිය සඳහා නව විස්තරාත්මක මෘදුකාංග පිරිවිතර වාර්තාවක් අත්සන් කිරීම.
2. යෝජිත මෘදුකාංග පද්ධතිය සඳහා නව වෙනස්කම් සඳහා පිරිවිතර වාර්තාවක් ඉදිරිපත් විම.
3. Google sheet මෙවලම යොදාගනිමින් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දෛනිකව බදවා ගැනීම් පිළිබඳව වාර්තා ලබාදීම.
4. Zoom තාක්ෂණය යොදාගනිමින් වසංගත කාලයේ දී පැවැත් වූ රැස්වීම මෙහෙය වීම හා තාක්ෂණික සහය ලබාදෙමින් ආයතනික ක්‍රියාවලින් හට සහය විම.
5. දිස්ත්‍රික් කාර්යාල සඳහා වන පරිගණක හා උපාංග ලබා දීම හා අළුත් වැඩියාවන් සිදු කිරීම.
6. වසංගත තත්ත්වය තුළ නොපමාව විශ්‍රාම වැටුප් ගෙවීම හා දෛනික රාජකාරි කටයුතු සඳහා තාක්ෂණික දායකත්වය ලබා දීම.

1.14. තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යය මණ්ඩලය

තනතුර		නිලධාරීන් සංඛ්‍යාව
සමාජ ආරක්ෂණ නිලධාරි (තොරතුරු තාක්ෂණ)	-	1
දත්ත පරිපාලක	-	1
පරිගණක වැඩසටහන් සහකාර (මෘදුකාංග)	-	1
පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග)	-	1
එකතුව	-	**4**

2. සමාජ ආරක්ෂණ අංශය

2.1. ප්‍රධාන කාර්යයන්

1. විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රචාරණය සහ ප්‍රවර්ධන කටයුතු සැලසුම් කිරීම හා මෙහෙයවීම.
2. සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් හා ඉලක්කගත ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
3. යෝජනාක්‍රමය පිළිබඳ දැනුවත් කිරීමෙන් පසුව සාමාජිකත්වය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
4. පසු වාරික මුදල් ගෙවීම සඳහා අදාළ මහපෙන්වීම සිදුකර ගෙවීම් කිරීමට අවශ්‍යවන පාස්පොත්, බැංකු බැරපත් ලබාදීම.
5. සාමාජික ගැටලු නිරාකරණය, අක්‍රීය තත්ත්වයකට පත්වන සමාජිකයන් සක්‍රීය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම.
6. ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ අංශය හා දිස්ත්‍රික් කාර්යාල 25ක් පරිපාලනය කරමින් සේවා කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.
7. ආයතන, නිලධාරීන් හා පොදුජන සංවිධාන සම්බන්ධීකරණය කරමින් විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරිම.

2.2. ප්‍රතිලාභ ගෙවීම

1. සාමාජිකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණවූ දින සිට ජීවිතාන්තය දක්වා අඛණ්ඩව මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
2. සාමාජිකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර සිදුවන සාමාජිකයාගේ මරණය වෙනුවෙන් යැපෙන්නන් සඳහා ප්‍රතිලාභ ගෙවීම , අර්ධ අබලතා, පූර්ණ අබලතා ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කිරීම.
3. “ආරස්සාව” පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ අතිරේක ප්‍රතිලාභ ගෙවීම.

2.3. සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල

ඔප්පු සේවා, විශ්‍රාම වැටුප්, රක්ෂණ හා ප්‍රවර්ධන වශයෙන් ප්‍රධාන කාර්යාලයේ සේවා ඒකක 04ක් සහ සියළුම දිස්ත්‍රික්ක වල පිහිටුවා ඇති කාර්යාල 25 මඟින් සේවා කටයුතු ඉටුකරනු ලැබේ.

2.4. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධ වන නිලධාරීන්

දිස්ත්‍රික් කාර්යාල සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්,සහයක කාර්ය මණ්ඩලය පත්කර ඇති අතර,ඔවුන් දිස්ත්‍රික් කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය හා සෘජු බදවාගැනීම් කටයුතු සිදුකරනු ලැබේ. විවිධ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා ආයතන සමඟ ඒකාබද්ධව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී එම නිලධාරීන්ගේ මැදිහත්වීම ලබා ගැනීමට කටයුතු කර ඇත.

2.5. සමාජ ආරක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය

ප්‍රධාන කාර්යාලයේ කාර්යය මණ්ඩලය

තනතුර		**තනතුරු සංඛ්‍යාව**
නි.සාමාන්‍යාධිකාරි (සමාජ ආරක්ෂණ)	-	01
ස.සාමාන්‍යාධිකාරි (බදවාගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන)	-	01
ස.සාමාන්‍යාධිකාරි (විශ්‍රාම වැටුප්/රක්ෂණ)	-	01
කළමනාකරුවන් / සම්බන්ධීකරණ නිලධාරින්		
කළමනාකරු (ඔප්පු සේවා)	-	01
කළමනාකරු (රක්ෂණ)	-	01
සමාජ ආරක්ෂණ නිලධාරි (විශ්‍රාම වැටුප්)	-	01
සමාජ ආරක්ෂණ නිලධාරි (ප්‍රවර්ධන)	-	01
සම්බන්ධීකරණ නිලධාරින්	-	06
කළමනාකරණ සහකාර	-	14
කාර්යාල කාර්ය සහයක	-	02
එකතුව		**29**

දිස්ත්‍රික් කාර්යාලයන්හි කාර්යය මණ්ඩලය

තනතුර		**තනතුරු සංඛ්‍යාව**
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී	-	06
සම්බන්ධීකරණ නිලධාරි	-	35
කළමනාකරණ සහකාර	-	23
කාර්යාල කාර්යය සහයක	-	21
එකතුව		**85**

2.6. 2021 වර්ෂයේ සාමාජිකයින් බඳවාගැනීමේ ප්‍රගතිය

2021 වර්ෂයේ දී සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දිස්ත්‍රික් මට්ටමින් බඳවාගත් නව සාමාජිකයන් පිළිබඳ ප්‍රගතිය

අනු අංකය	දිස්ත්‍රික්කය	2021 වර්ෂයේ බඳවා ගැනීම් (සාමාජිකයින්)
01	යාපනය	13,389
02	මඩකලපුව	8,865
03	කිලිනොච්චිය	7,461
04	කුරුණෑගල	4,674
05	අම්පාර	3,908
06	මුලතිව්	3,499
07	වව්නියාව	3,266
08	ත්‍රිකුණාමලය	2,516
09	මන්නාරම	1,954
10	මහනුවර	1,370
11	කෑගල්ල	1,360
12	බදුල්ල	1,220
13	නුවරඑළිය	844
14	මාතර	648
15	ගාල්ල	441
16	අනුරාධපුරය	349
17	මොණරාගල	345
18	හම්බන්තොට	294
19	කොළඹ	251
20	කළුතර	249
21	ගම්පහ	206
22	මාතලේ	200
23	පොළොන්නරුව	134
24	පුත්තලම	127
25	රත්නපුරය	80
26	සෘජු බඳවාගැනීම්	76
	එකතුව	**57,726**


2021 වර්ෂයේ බඳවාගැනීම් (සාමාජිකයින්)
16,000
14,000
12,000
10,000
8,000
6,000
4,000
2,000
0
13,389
8,865
7,461
4,674
3,908
3,499
3,266
2,516
1,954
1,370
1,360
1,220
844
648
441
349
345
294
251
249
206
200
134
127
80
76
යාපනය
මඩකලපුව
කිලිනොච්චිය
කුරුණෑගල
අම්පාර
මුලතිව්
වව්නියාව
ත්‍රිකුණාමලය
මන්නාරම
මහනුවර
නුවරඑළිය
මාතර
ගාල්ල
අනුරාධපුරය
මොණරාගල
හම්බන්තොට
කොළඹ
කළුතර
ගම්පහ
මාතලේ
පොළොන්නරුව
පුත්තලම
රත්නපුරය
සෘජු බඳවාගැනීම්

නව සාමාජිකයින් බඳවාගැනීමේ වාර්ෂික ප්‍රගතිය

අනු අංකය	වර්ෂය	නව බඳවාගැනීම් සංඛ්‍යාව	පළමු වාරික මුදල (රු.) (මිලියන)	වාර්ෂික වාරික රැස්කිරීම් (රු.) (මිලියන)
01	2012	9,184	6.35	186.45
02	2013	8,769	7.24	150.37
03	2014	15,995	7.66	148.99
04	2015	21,599	13.79	146.38
05	2016	72,351	40.81	148.87
06	2017	63,141	36.84	170.96
07	2018	83,362	52.18	190.46
08	2019	38,543	37.26	198.04
09	2020	25,778	45.07	180.26
10	2021	57,726	128.04	177.57



2.7. 2021 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම

විස්තරය	සංඛ්‍යාව	වියදම (රු.)
විශ්‍රාම වැටුප් ගෙවීම්	**32,976**	**356,981,876.00**
මරණ පාරිතෝෂික ගෙවීම්	**26**	1,584,866.00
ආබාධිත පාරිතෝෂික ගෙවීම්	**27**	**713,451.00**
අතිරේක ප්‍රතිලාභ (5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස: සා/පෙ, අ.පො.ස: උ/පෙ)	**342**	**3,106,499.00**
එකතුව	**33,371**	**362,386,692.00**

ශුද්ධ දායක මුදල් ආපසු ගෙවීම්	**සංඛ්‍යාව**	**මුදල (රු.)**
	649	**18,449,415.29**

2.8. 2021 වර්ෂයේ දායකයින්ගේ අය කළ මුදල්

බදවාගැනීම් සහ වාරික රැස්කිරීම්	ලැබීම් (රු.)
බදවාගැනීමේ මුල් වාරික මුදල	**128,046,812.00**

2.9. 2021 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන

	සංඛ්‍යාව	වැය වූ මුදල (රු.)
විශ්‍රම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන්	107	1,973,814.00

2.10. සමාජ ආරක්ෂණ අංශයේ ගැටලු

1. පුහුණුව ලත් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත්වීම බහුලව පැවතීම හේතුවෙන් සේවක පිරිවැටුම ඉහළ අගයක් ගෙන ඇති අතර, නව නිලධාරීන් බඳවාගැනීම හා ඔවුන් පුහුණුකර සේවයේ යෙදවීම.

2. 2021 වර්ෂය පුරා පැවති කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තියත් සමග සංචරණ සීමා ක්‍රියාත්මකවීම, ප්‍රදේශ හුදෙකලා කිරීම, ජනතාව එක්රැස් කිරීමේ කටයුතු සමාජ දුරස්ථභාවය සහිතව සීමාකිරීමට සිදුවීම හා ජනතාවගේ ආදායම් තත්ත්වයන් පහත වැටීම හේතුවෙන් වසර මුල් භාගයේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමේ අපහසුතා පැවතුණි.

3. පරිගණක පද්ධතිය නිසිපරිදි ක්‍රියාත්මක නොවීම කාර්යක්ෂම සේවයක් ලබාදීම කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇතිකරන ලදී.

03. මුදල් අංශය

කාර්යයභාරය

- වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම.
- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම.
- මාසික අක්මුදල් වාර්තා පිලියල කිරීම (වාර්ෂික අයවැය ප්‍රසම්පාදන මත)
- 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන වලට අනුව වාර්ෂික මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා නියමිත වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- මහා භාණ්ඩාගාරයට, රේඛීය අමාත්‍යාංශයට හා කළමනාකරණ කාර්යයන් සඳහා අවශ්‍ය වන මුල්‍ය වාර්තාවන් වරින් වර පිළියෙල කිරීම.
- මුදල් අංශයට අදාල සියලුම ගිණුම් යාවත්කාලීන කිරීම.
- සියලුම ගණුදෙනු වලට අදාළ බැංකු ගිණුම් ක්‍රමානුකූලව පවත්වා ගෙන යාම සහ බැංකු සැසඳුම් වාර්තා පිලියෙල කිරීම.
- මාසික විශ්‍රාම වැටුප් සහ අනෙකුත් සියලුම ගෙවීම් සිදුකිරීම සහ ගිණුම්ගත කිරීම.
- දායකයින්ගෙන් ලබාගන්නා මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු කිරීම තුළින් ආයතනය සතු ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.
- කාර්යය මණ්ඩලය සඳහා මාසිකව වැටුප් සැකසීම හා අදාළ වාර්තාවන් පිළියෙල කිරීම.
- කළමනාකරණයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා විධිමත් හා නිවැරදි තොරතුරු ලබාදීම.
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ සාමාජික මුදල් තැන්පතු භාර ගැනීම හා බැංකුගත කිරීම.
- මණ්ඩලය අවශ්‍ය සියලුම භාණ්ඩ හා සේවාවන් සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම.

3.1. පොදු කරුණු

සියලු වෙක්පත් ලිවීම් ගිණුම් සැකසීමේ කාර්යයන් හා වැටුප් සැකසීම් පරිගණක ගතකර ඇත.

වාර්ෂිකව රුපියල් මිලියන 357 ක් පමණ දායකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අතර දිවයින පුරා පිහිටි සමුපකාර ග්‍රාමීය බැංකු 2000ක් තුළින් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කෙරේ.

දැනට දිවයින පුරා පිහිටි මහජන බැංකු, ලංකා බැංකු , ජාතික ඉතිරිකිරීමේ බැංකු, ප්‍රාදේශිය සංවර්ධන බැංකුව තුළින් හා තැපැල් කාර්යාල මඟින් දායකයින්ගේ මුදල් එකතුවීම සිදුවේ. විදේශ රටවල සේවා නියුක්තිකයන් වෙනුවෙන් නේවාසික විදේශ මුදල් ගිණුමක් ද (RFC) මහජන බැංකුවේ ආරම්භ කර ඒ හරහා ද දායකයින්ගේ වාරික මුදල් එකතු කිරීම සිදු කෙරේ.

3.2 ආයතනය සතු වත්කම්

අනු අංකය	විස්තරය	2021.12.31 දිනට වටිනාකම (රු.)
01	ගොඩනැගිලි	81,757,550.00
02	ඉඩම්	97,050,000.00
03	මෝටර් රථ	10,883,677.00
04	කාර්යාල උපකරණ	8,915,912.00
05	පරිගණක	5,139,198.00
06	සන්නිවේදන උපකරණ	-
07	පරිගණක මෘදුකාංග	320,080.00
08	වෙනත්	100,225.00
09	යන්ත්‍ර උපකරණ හා කාර්යාල උපකරණ	1,454,482.00
	එකතුව	**205,621,124.00**

3.3 2021 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන

3.3.1 පුනරාවර්තන

භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන (2021) (රු.)	වියදම (රු.)
125,609,000.00	129,874,497.00

3.3.2 ප්‍රාග්ධන

භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන (2021) (රු.)	වියදම (රු.)
13,000,000.00	6,811,323.00

3.4 මුදල් අංශයේ කාර්යය මණ්ඩලය

තනතුර		නිලධාරීන් සංඛ්‍යාව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)	-	01
සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්)	-	01
ගිණුම් නිලධාරි (මුදල්)	-	01
ගිණුම් නිලධාරි (රැස්කිරීම්)	-	01
පොත් තබන්නා	-	01
කළමනාකරණ සහකාර	-	13
කාර්යාල කාර්ය සහයක	-	02
එකතුව	-	**20**

4. අභ්‍යන්තර විගණන අංශය

4.1. විෂය පථය

- අභ්‍යන්තර පාලන ව්‍යුහය, අධිකාරීත්ව සීමාවන් හඳුනාගැනීම සහ පරිපාලන කටයුතුවල කාර්යක්ෂමතාව සහ කාර්යය මණ්ඩල කාර්ය සාධනයේ ගුණාත්මක බව ඇගයීම
- ගණුදෙනු ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පාලනය සහ අයවැය, නීති හා රෙගුලාසිවලට දක්වා ඇති අනුකූලතාව පරීක්ෂා කිරීම
- මෙහෙයුම් ක්‍රියාවලිය සහ ප්‍රවර්ධන කටයුතුවල කාර්යක්ෂම බව සහ සාර්ථකත්වය ඇගයීම.
- වත්කම්වල පාලනය සහ ආරක්ෂාව ඇගයීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව නව ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම්වල ප්‍රගතිය ඇගයීම
- දිස්ත්‍රික් කාර්යාලවල කාර්ය සාධනය සහ මූල්‍ය හා පරිපාලන කටයුතුවල ප්‍රගතිය පරීක්ෂාව

4.2. කාර්යයභාරය

- අනුමත සේවක සංඛ්‍යාව ,කාර්යය මණ්ඩල බදවා ගැනීම් සහ පුද්ගලික ලිපිගොනු පරීක්ෂාව
- කාර්යය මණ්ඩල පැමිණීම පිටවීම සහ නිවාඩු පරීක්ෂාව
- කාර්යමණ්ඩල පුහුණු සහ සංවර්ධන ක්‍රියාමාර්ග පරීක්ෂාව
- වාහන ධාවනය සහ නඩත්තු කටයුතු පරීක්ෂාව
- නඩත්තු කටයුතු හා සනීපාරක්ෂක සහ ආරක්ෂක සේවා කටයුතු පරීක්ෂාව
- භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් සහ දායක වාරික මුදල් ලැබීම් පරීක්ෂාව
- ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂාව
- අනිකුත් පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් පරීක්ෂාව
- බැංකු ගිණුම් සහ බැංකු සැසඳුම් පිළියෙළ කිරීම පරීක්ෂාව
- ආයෝජන කටයුතු පරීක්ෂාව
- ගිණුම් වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, පරීක්ෂා කිරීම
- දායක බදවා ගැනීම් හා අයදුම්පත් පරිගණක ගත කිරීම හා ඔප්පු නිකුත් කිරීම සහ පරීක්ෂාව
- වාරික අයකිරීම, ප්‍රේෂණය සහ ගිණුම් ගත කිරීම පරීක්ෂාව
- ප්‍රතිලාභ ගෙවීම් කටයුතු පරීක්ෂාව
- දායකත්වයෙන් ඉවත්වීම සඳහා ගෙවීම් පරීක්ෂාව
- ප්‍රවර්ධන කටයුතු සහ වැඩසටහන් පරීක්ෂාවට ලක්කිරීම
- සැලසුම් සකස් කිරීම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව
- ක්ෂණික පරීක්ෂා කිරීම්
- දිස්ත්‍රික් කාර්යාල ඇතුළු ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම්
- විශේෂ පැවරුම්
- ජාතික විගණන කාර්යාල විගණන විමසුම් සහ වාර්තා සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධීකරණය
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම සම්බන්ධීකරණය

4.3. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2021 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් පැවති දිනයන්

පළමු රැස්වීම	-	2021පෙබරවාරි 24
දෙවන රැස්වීම	-	2021 ජූලි 13
තෙවන රැස්වීම	-	2021 ඔක්තෝබර් 07
සිව්වන රැස්වීම	-	2021 දෙසැම්බර් 23

4.4. 2021 වර්ෂයේ දී ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා

	අභ්‍යන්තර විගණන වාර්තා විෂයය	ඉදිරිපත් කළ දිනය
01	වාරික රැස්කිරීම සහ පරිගණකගත කිරීම (ක්‍රියාවලි පරීක්ෂාව) – පළමු වාර්තාව	2021.03.31
02	වාරික රැස්කිරීම සහ පරිගණකගත කිරීම (ක්‍රියාවලි පරීක්ෂාව) – දෙවන වාර්තාව	2021.03.31
03	දායකත්වයෙන් ඉවත්වීම් සඳහා ගෙවීම්	2021.04.22
04	ස්ථාවර වත්කම් පාලනය	2021.04.30
05	කොවිඩ් 19 අර්බුදකාරී කාල පරිච්ඡේදය හමුවේ ශ්‍රී ලංකාවේ රක්ෂණ හා විශ්‍රාම වැටුප් කර්මාන්තය	2021.06.30
06	විදුලිය සහ ජල වියදම	2021.07.16
07	ආයෝජන	2021.09.21
08	කුවිතාන්සි පොත් මුද්‍රණය හා නිකුත් කිරීම	2021.10.29
09	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ඔප්පු සේවා ඒකකයේ ක්‍රියාවලි අධ්‍යයනය හා නිම කිරීමට ඇති වැඩ හදුනාගැනීම	2021.11.24
10	දුරකථන සහ සන්නිවේදන වියදම්	2021.12.28
11	සුළු මුදල් පරීක්ෂාව	2021.12.30

- **දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව**

	දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	වාර්තාව ඉදිරිපත් කළ දිනය
01	ගම්පහ දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	2021.11.03
02	පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	2021.11.10
03	පුත්තලම දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	2021.11.25
04	කළුතර දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	2021.12.24
05	කළුතර දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	2021.12.28
06	මාතර දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	2021.12.29

<u>විශේෂ පැවරුම් වාර්තා</u>

- 2019 වර්ෂයේ දිස්ත්‍රික් කාර්යාලවල සේවය කර ඇති ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි,සම්බන්ධීකරණ නිලධාරි සහ වැඩ බලන සම්බන්ධීකරණ නිලධාරීන්ගේ රාජකාරි ඉටු කිරීමේ සඵලතා අධීක්ෂණය

4.5. අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය

තනතුර	**නිලධාරී සංඛ්‍යාව**
අභ්‍යන්තර විගණක	01
විගණන නිලධාරි	02
විමර්ශන නිලධාරි	02
එකතුව	**05**

ස්තූතිය

රාජ්‍ය විශ්‍රාම වැටුප් හිමිකම නොමැති තැනැත්තන්ගේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමය වඩාත් සුරක්ෂිත කිරීම සඳහා විශ්‍රාම වැටුප් රැකවරණය සැලසීම හා වෙනත් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම සඳහා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත. එම කාර්යයභාරය ඉටුකිරීමේ දී පරිපාලන මෙහෙයුම් සම්බන්ධීකරණය ආදි සෑම අංශයකින්ම සහය දක්වන ලද සැමට ස්තූතිය ප්‍රකාශ කරමු.

- මුදල් අමාත්‍යාංශය
- සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
- ජාතික විගණන කාර්යාලය
- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
- දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශිය ලේකම්වරුන්
- සමාජ සේවා නිලධාරින්, ග්‍රාම නිලධාරින්
- මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- තැපැල් දෙපාර්තමේන්තුව
- සමූපකාර ග්‍රාමීය බැංකු ජාලය
- විවිධ අයුරින් සහය දක්වන ලද සැමට

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

සමාජ ආරක්ෂණ පියස

අංක 18, රාජගිරිය පාර,

රාජගිරිය.



වසර අවසානය සඳහා මූල්‍ය ප්‍රකාශය 2021

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
කාන්තා, ළමා කටයුතු හා
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

"සමාජ ආරක්ෂණ පියස",
අංක 18, රාජගිරිය පාර,
රාජගිරිය.

දුරකථන: 0112 886 585/86
ක්ෂණික ඇමතුම්: 0112 88 60 88
වෙබ්: www.ssb.gov.lk
ඊමේල්: Info@ssb.gov.lk

පටුන පිටු අංකය

ගිණුම්කරණ ප්‍රතිපත්ති 01-05

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 06-06

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 07-07

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 08-08

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 09-09

මූල්‍ය කාර්ය සාධනය සඳහා සටහන් 10-12

මූල්‍ය තත්ත්වය සඳහා සටහන් 12-18

ආයෝජන ලේඛනය 19-19

සමාජ ආරක්ෂණ මණ්ඩල අරමුදල සඳහා ආදායම් සහ වියදම් අරමුදල 20-20

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශයන්ට අදාල සටහන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සංස්ථාමය තොරතුරු

1.1 වාසස්ථාන සහ නෛතික ආකෘතිය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් වර්ෂ 1996 අංක 17 දරණ පනත මගින් ස්ථාපිත කරන ලදුව, වර්ෂ 1999 අංක 33 දරණ පනත මගින් එම මුල් පනත සංශෝධනය කර ඇත. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත්වීමත් සමඟ වර්තමානයේදී එහි සේවා කටයුතු තව දුරටත් පුළුල් වී තිබේ. මෙහි ප්‍රධාන කාර්යාලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය යන ස්ථානයේ ස්ථාපනය කර ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම් නොමැති තැනැත්තන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා මාසික විශ්‍රාම වැටුප් ලබා දීම, හදිසි අකර්මන්‍යතාවයන්හිදී හා මරණයේදී මූල්‍ය සහනය ලබා දීම සඳහා, විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. රජයේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් ප්‍රායෝගිකව ක්‍රියාවට නගමින් රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති පුරවැසියන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යය භාරය වේ.

1.3 සේවකයින් සංඛ්‍යාව

වර්ෂය අවසානය වන විට සිටි සේවකයන් සංඛ්‍යාව වනුයේ 161 කි.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශයන්ට ඇතුළත් වනුයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශයන්ට අදාල සටහන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකාරී ප්‍රමිතීන්ට අනුකූලවය. (SLPSAS)

2.2. මිනුම් කිරීමේ පදනම

ඓතිහාසික පිරිවැය ප්‍රඥප්තිය පදනම් කර ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කොට තිබේ. ගිණුම් කෙරෙහි බලපාන උද්ධමනකාරී කරුණු සැලකිල්ලට ගෙන ඒවා වෙනස් කර නොමැත.

2.3 මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ ඉදිරිපත් කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇති අතර ඒවා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරී මුදල් වේ.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මෙම මූල ප්‍රකාශ වල දක්වා ඇති සියලු කාල සීමා වලට ඒකාකාරව අනුකූලව වන පරිදි යොදා ගෙන තිබේ.

3.1. දේපල, යන්ත්‍ර සහ උපකරණ

දේපල, යන්ත්‍ර සහ උපකරණ වල පිරිවැය යනුවෙන් දක්වනුයේ එහි අරමුණුගත කාර්යය සඳහා වත්කම් අත්කර ගැනීම සහ හෝ ඉදිකිරීමේ වියදම් පමණක් නොව වත්කම් ක්‍රියාකාරී තත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන ඕනෑම වියදමක්ද ඇතුළත් පිරිවැයකි. පිරිවැය වශයෙන් වත්කමක් මූලිකව හඳුනා ගැනීමෙන් පසුව වත්කම් ප්‍රති තක්සේරු කිරීම් කරනු ලබනුයේ එහි පසුකාලීනව සිදු විය හැකි ඕනෑම ක්ෂයවීමක් අඩු කළ ප්‍රති තක්සේරු කිරීම් කරනු ලබන ප්‍රමාණයකට වේ. අනිකුත් සියළුම දේපල, යන්ත්‍ර සහ උපකරණ දක්වා තිබෙනුයේ සමුච්චිත ක්ෂය කිරීම් අඩුකළ පිරිවැය ලෙස වේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් වල විවිධ ප්‍රයෝජන සහිත ප්‍රධාන කොටස් අඩංගු වේ, ඒවා දේපල, බලාගාර හා උපකරණ අයිතමය වශයෙන් ලෙස වෙන් වෙන්ව ගණනය කරනු ලැබේ.

එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ දී, අදාළ වන්නේ නම් වත්කම් වල ශේෂ වටිනාකම්, ප්‍රයෝජනවත් ආයු කාලය හා ක්ෂය වීම් ක්‍රම ඒවා අදාළ වන්නේ නම් සමාලෝචනය කර ගැලපුම් කර ලබා දී තිබේ.

ප්‍රදානයක් ලෙස අත්පත් වන දේපල, යන්ත්‍ර සහ උපකරණ

කිසියම් ප්‍රදානයක් ලෙස අත්පත් වන දේපල, යන්ත්‍ර සහ උපකරණ පිරිවැය යටතේ ප්‍රාග්ධනිකරණය කෙරේ.

දේපල, යන්ත්‍ර සහ උපකරණ සහ වෙනත් සින්නක්කර ඉඩම් දක්වා තිබෙනුයේ සමුච්චිත ක්ෂය කිරීම් අඩුකළ පිරිවැය ලෙස වේ. සින්නක්කර ඉඩම් වල පිරිවැය ප්‍රකාශිත වේ.

ඇස්තමේන්තුගත ආයු කාලයට වඩා පිරිවැය කපා හැරීම සඳහා සින්නක්කර ඉඩම් හැර වෙනත් සියලු දේපල, පිරිස් සහ උපකරණ මත ක්ෂය වීමක් අය කෙරේ.

අනුපාතික පදනම මත වර්ෂය සඳහා ක්ෂයවීම් ලබා දී ඇත.

දේපල, යන්ත්‍ර සහ උපකරණ සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ පහත දක්වා ඇති පරිදි සෘජු රේඛා ක්‍රමය පදනම් කොට ගෙන වේ. එසේම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකාරී ප්‍රමිතීන් වල දක්වා ඇති පරිදි සියළුම දේපල, යන්ත්‍ර සහ උපකරණ වල ක්ෂයවීම ගණනය කර ඇත්තේ පිරිවැය ක්‍රමය යටතේ වේ **(SLPSAS 7)**

1. **මෝටර් රථ**	20%
2. **දේපල, යන්ත්‍ර සහ උපකරණ**	25%
3. **පරිගණක සහ වෙනත් ස්ථාවර වත්කම්**	25%
4. **සන්නිවේදනය**	20%
5. **ලී බඩු සහ කාර්යාලීය උපකරණ**	10%
6. **ගොඩනැගිලි**	4%
7. **වෙනත්**	10%.
8. **මෘදුකාංග**	25%

බැහැර කරනු ලබන හෝ ඒවා බැහැර කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික වටිනාකමක් හෝ අපේක්ෂා කළ නොහැකි ඒකක ආර්ථික වටිනාකමක් නොමැති දේපල, යන්ත්‍ර සහ උපකරණ යටතට දක්වනු ලැබේ. (මෙලෙස ආර්ථික වටිනාකමක් නොමැතිව බැහැර කරනු ලබන දේපලක යම්කිසි ලැබීමක් හෝ අහිමි වීමක් ගණනය කරනුයේ ශුද්ධ බැහැර කිරීමේ ඉපැයීම් අතර වෙනස වශයෙන් අතර දෙපළ බැහැර කරනු ලබන වර්ෂයේ ආදායම් ගිණුමේ මෙම අගය දක්වා ඇත.

මුල් තක්සේරුගත කාර්යසාධන ප්‍රමිතිය තුලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වා ගැනීමට හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා දේපල, යන්ත්‍ර සහ උපකරණ පවත්වා ගැනීම හෝ අළුත්වැඩියා කිරීම මත වැයවන වනුයේ පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

2020 මූල්‍ය වර්ෂයේදී ඉඩම් සහ ගොඩනැගිලි නැවත තක්සේරු කර ඇති අතර නැවත තක්සේරු කිරීමට සලකා බැලූ ගොඩනැගිලිවල පිරිවැය නිවැරදි කර ඒ අනුව ගිණුම්ගත කර ඇත. විස්තර සටහන 15 හි දක්වා ඇත.

3.2 ඉන්වෙන්ට්‍රි

මූල්‍ය වර්ෂය තුළදී භාවිතා කළ ඉන්වෙන්ට්‍රි, ආදායම් හා වියදම ප්‍රකාශයේ දක්වා ඇත.

තොග ශේෂ තක්සේරු කරනුයේ පිරිවැය, විකුණුම් මිල හෝ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයෙන් වඩා අඩු අගය ඇති දර්ශකය මත වේ.

3.3. ආයෝජන
වසරකට වඩා අඩු කල්පැවැත්මක් සහිත මුදල් වෙලඳපොල අයෝජනයන් කෙටි කාලීන ආයෝජන ලෙස සලකනු ලබන අතර, වසරකට වැඩි කාලයක් දිගුකාලීන ආයෝජන ලෙස සලකනු ලැබේ. තවද සියලුම ආයෝජන පිරිවැය ලෙස දක්වා ඇත.

සංසන්දනාත්මක අරමුණු සඳහා, වත්මන් සහ දිගුකාලීන ආයෝජන 2020 වර්ෂය සඳහා නැවත ප්‍රකාශ කරනු ලැබේ.

ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය පිරිවැය ලෙස දක්වා ඇත. එවැනි ආයෝජනවලින් ලැබෙන ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත.

3.4. මුදල් සහ මුදල් වලට සමාන දෑ

මේ යටතට ගැනෙනුයේ අත ඇති මුදල් සහ බැංකු තැන්පතු වේ.

3.5. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකසා තිබෙනුයේ අනියම් ක්‍රමයකට වේ.

3**.6. බැරකම් සහ ප්‍රතිපාදන**

ශේෂ පත්‍රයේ වත්මන් බැරකම් යටතේ සඳහන් කර ඇති බැරකම් ශේෂ පත්‍රයේ දිනයෙන් වර්ෂයක් ඇතුළත අයවීමට අපේක්ෂිත පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් වන අතර මෙම අයවීම් නිරවුල් වීම තුළින් ආර්ථික ප්‍රතිලාභ රැගත් සම්පත් පිටතට ගලා යෑමක් අපේක්ෂා කෙරේ. ණය හිමියන්ගේ ඉල්ලීම මත ගෙවිය යුතු ගෙවීම් හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු ගෙවීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස සැලකේ.

පසුගිය අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට වර්තමානයේදී නීත්‍යානුකූල හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් අතිවීමකදී එලෙස ඇතිවූ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත්වන සම්පත් පිටාර ගැලීමක් අවශ්‍ය විය හැක

සංස්කෘතික අරමුදල් ආයෝජනය සඳහා පොලී

2017 මූල්‍ය වර්ෂයේ සිට, සංස්කෘතික ආයෝජන මත ලැබිය යුතු පොලී ආදායමෙන් 98%ක් SLSSB ආදායම ලෙස වැරදි ලෙස සලකනු ලැබිණි. මෙම මුදල සාමාජිකයාගේ ගිණුම් විවෘත කිරීමේ අරමුණ සඳහා අනිවාර්ය වන බැවින්, දැන් වගකීම් ගිණුමට මාරු කරනු ලැබේ. සමුච්චිත අරමුදල් ගිණුමේ අනුරූප ගැලපීම සිදු කෙරේ.

3.7. බදු අය කිරීම

වර්ෂ 2006 අංක 10 දරණ දේශීය අදායම් පනතේ විධිවිධාන සහ එකී පනතට සිදුකරනු ලබන සංශෝධනය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කොට තිබේ.

3.8 සේවක ප්‍රතිලාභ

I. දායක මුදල් සැලැස්ම අර්ථ දැක්වීම.

දායක මුදල් සැලැස්මේ බැඳීම්, ආදායම් ප්‍රකාශනයේ දැරිය යුතු වියදම් ලෙස හඳුනා ගැනේ. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය අර්ථසාධක අරමුදල් සඳහා 12% ක් සහ භාරකාර අරමුදල් සඳහා සේවකයින්ගේ දළ වැටුපෙන් 3% ක්ද වන පරිදි දායකත්වය ලබාදේ.

II. ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

ප්‍රතිලාභ සැලැස්ම යනු පාරිතෝෂිකය වේ. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය අදාළ ප්‍රඥප්තිය අනුව පාරිතෝෂික ගෙවීමට වග බලා ගත යුතුය. මෙම වගකීම් පූර්ණය කිරීම සඳහා,ප්‍රතිපාදන ශේෂ පත්‍රයේ ඉදිරියට රැගෙන එනු ලබන අතර එය සේවයේ පළමු වසරේ සිට ආරම්භ කරන සෑම සේවක වර්ෂයක් සඳහාම සියළුම සේවකයින්ගේ මූල්‍ය වර්ෂයේ අර්ධ මාසයක වැටුප ගණනය කරන ලද මුදලකට සමාන වේ.

වර්ෂ 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික ගෙවිය හැකි සියළුම සේවකයන් වෙත විශ්‍රාම පාරිතෝෂික ලබා දෙනු පිණිස ප්‍රතිපාදන සලසා ඇත. මෙම අයිතමය ශේෂ පත්‍රයෙහි නොගෙවූ වගකීම් යටතේ වර්ගීකරණය කර ඇත.

භාණ්ඩාගාරයට අනුව, අවශ්‍ය වන විට අරමුදල් ප්‍රදානය කරන බැවින් අරමුදල් අවශ්‍ය නොවේ.

3.9. ආදායම් හඳුනා ගැනීම

3.9.1 ආදායම් හඳුනා ගැනීම

බදවාගැනීමේ ගාස්තු සහ දායකයින්ගේ වාරික ගිණුම් ගත වනුයේ මුදල් පදනම මත වන අතර පොලී ආදායම් සහ අනිකුත් සියළුම ආදායම් උපචිත පදනමින් ගිණුම්ගත වේ

3.9.2 වියදම්

මණ්ඩලය පවත්වා ගැනීම සඳහා වැයවන සියළුම මුදල් උපචිත පදනමින් ගිණුම්ගත වන අතර ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ආදායම් ධාරිතාවය එලෙස පැවතීම හෝ ආදායම් ධාරිතාවය වැඩි කිරීම අරමුණු කොට ගෙන ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා වැයවන මුදල් ප්‍රාග්ධන වියදම් ලෙස හැඳින්වේ.

3.10. සංසන්දනාත්මක තොරතුරු

එය අවශ්‍ය වූ විට, සංසන්දනාත්මක සංඛ්‍යා වත්මන් වර්ෂය ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි නැවත සකස් කර ඇත.

3.11. ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවන සිදුවීම්

සියළු ද්‍රව්‍ය පශ්චාත් ශේෂ පත්‍ර පිළිබඳ සිදුවීම් සලකනු ලබන අතර ගිණුම් ප්‍රකාශනයේ අදාළ සටහනට සුදුසු පරිදි ගැලපීම හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

3.12. බැඳීම් සහ අවිනිශ්චිත ප්‍රතිපාදන

අතීත සිදුවීම් වලින් ඇතිවිය හැකි වත්කම් හෝ බැඳීම් අවිනිශ්චිත ප්‍රතිපාදන යටතට ගනු ලබන අතර ඒවා නිශ්චිත වනුයේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට පාලනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම්වල සිදුවීම හෝ සිදු නොවීම මත පමණි.

3.13. ප්‍රදානයන් ගිණුම්ගත කිරීම

i. රාජ්‍ය ප්‍රදාන

ඉදිරිපත් කිරීමේ ක්‍රම ඇතුළුව රාජ්‍ය ප්‍රදාන සඳහා අනුගත ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත දැක්වේ.

අ. වත්කම් මිලදී ගැනීමට යෙදෙන රජයේ ප්‍රදානයන් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සඳහා ආදායම ලෙස පිළිගනු ලැබේ.

ආ. අරමුදල් සහ වියදම් තුලින් ලැබුණු අනිකුත් ප්‍රදාන ලාභ සහ අලාභ වලට ඇතුළත් කොට තිබේ.

SRI LANKA SOCIAL SECURITY BOARD
STATEMENT OF FINANCIAL POSITION
AS AT 31ST DECEMBER 2021

	NOTE	2021 Rs	2020 Rs
ASSETS			
CURRENT ASSETS			
CASH IN HAND AND BANK	9	55,308,307	27,094,773
DEPOSITS	10	76,000	76,000
ADVANCES	11	-	50,725
STAFF LOAN	12	9,591,992	10,936,230
OTHER ASSETS	13	884,762,704	669,516,323
INVESTMENT	14	104,930,150	315,491,643
